museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ (MMCA ශ්‍රී ලංකා) බාහිර අධ්‍යාපනඥ වැඩසටහන (VE) කෞතුකාගාරයේ නරඹන්නන්ගේ අත්දැකීම වැඩි දියුණු කිරීම හා ශ්‍රී ලංකාවේ සංස්කෘතික කර්මාන්ත තුළ ධාරිතාව ගොඩනැගීම අරමුණුකරගත් මුලපිරීමකි. 2019 දෙසැම්බර් දියත් කළ බාහිර අධ්‍යාපනඥ (VE) පුහුණු තනතුර හා වැඩසටහන ශ්‍රී ලංකාවේ එයාකාරයේ ප්‍රථම වැඩසටහන වෙයි. නරඹන්නන් හා කෞතුකාගාරය සම්බන්ධවන පළමු ලක්ෂ්‍ය ලෙස වැදගත් භූමිකාවක් ඉටු කරන MMCA ශ්‍රී ලංකාහි බාහිර අධ්‍යාපනඥයන් විසින් නරඹන්නන්ට සංදර්ෂිත කලාකෘති පිළිබඳ ඉගෙනීමට හා ඒ සමඟ නියැලීමට අවස්ථාව සැලසීම, සංදර්භය සැපයීම, හා සෑම වයස් කාණ්ඩ හා මට්ටම් සඳහාවූ සංවාද, සංචාර, හා අධ්‍යාපන ක්‍රියාකාරකම් තුළින් සමීපව බැලීමේ ක්‍රම හඳුන්වාදීම යන කාර්ය ඉටු කරයි. ප්‍රදර්ශනයේ කලාකෘති රැකගැනීමට ද, සෞඛ්‍ය සහ ආරක්ෂිත මාර්ගෝපදේශ නිරීක්ෂණය කිරීමට ද, එහි සතිපතා පැවැත්වෙන මහජන වැඩසටහන් මෙහෙයවීමට ද බාහිර අධ්‍යාපනඥයන් සහාය ලබා දෙයි.

රෙසාහ් සම්සුදීන්, මැතිව් රොජර්, හුසේන් නිසාම්, ප්‍රබෝධි නවෝද්‍යා, සහ විරන්දි කුලරත්න MMCA ශ්‍රී ලංකාහි බාහිර අධ්‍යාපනඥයන් ලෙස සිය ගමන පිළිබඳව ආවර්ජනය කරයි.

**ඔබ MMCA ශ්‍රී ලංකාවට බාහිර අධ්‍යාපනඥයෙකු ලෙස සම්බන්ධ වීමට හේතු වූයේ කුමක් ද?**

රෙසාහ්: 'මුණගැසීම්' නම් පසුගිය ප්‍රදර්ශනයේදී ශාර්මිණී මෙහෙයවූ විශ්වවිද්‍යාල සංචාරයකට මං සහභාගීවී සිටියා. එහිදී, ඇය ප්‍රදර්ශනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය සියලු කටයුතු පිළිබඳව කතා කළා. ප්‍රදර්ශන නිර්මාණ සැලසුම්කරණයට මම කලින් සිට ම උනන්දුවක් දැක්වූ නිසා සීමාවාසික පුහුණුව සඳහා බඳවාගැනීම් කිසිවක් විවෘතව තිබෙනවාදැයි මම විමසුවා. එම වෙලාවේ කිසිවක් නොතිබූ නිසා ඔවුන් මට බාහිර අධ්‍යාපනඥ යන භූමිකාවට අයදුම්කිරීමට දිරිගැන්වූවා. කෙසේ වෙතත්, අපගේ වත්මන් ප්‍රදර්ශනය වන 'අක්කර 88හි' නිර්මාණ සැලසුම්කරණයේදී මට ප්‍රදර්ශන නිර්මාණ සැලසුම් සීමාවාසික පුහුණුව ලබා ගැනීමට හැකිවුණා.

මැතිව්: ආයතනික ක්ෂේත්‍රයෙන් තොරවූ වෙනස් දෙයක් සහ, මට අලුත් කුසලතා හා දැනුම ලබාගත හැකි මෙන් ම මගේ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීමට උපකාරවන තැනක් මම සොයමින් සිටියා. මෙම තනතුර සඳහා රැකියා නිවේදනය දැකපු වෙලාවෙ මට තේරුණා එය මම සොයන ආකාරයේ ම එකක් බව. තනතුරු නාමය සුවිශේෂ එකක් ලෙස හැඟුනා මෙන් ම සංවිධානය සහ එහි ඉලක්කය හා අරමුණු මට කැපී පෙනුණා.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

හුසේන්: ස්වේච්ඡා සේවයට මගේ හදවතේ සැම විට ම විශේෂ ස්ථානයක් ඇති අතර, කොළඹ පැවති සමකාලීන කලා උළෙලක මට මගේ ආරම්භක අවස්ථාව හිමිවුණා. කලාවේ අසීමිත විභවය පිළිබඳ දැනුම හැමෝට ම ලබා දීමේ අරමුණාත් සමඟ MMCA ශ්‍රී ලංකාවට බාහිර අධ්‍යාපනඥයෙකු ලෙස එක් වීමට ඇති උනන්දුව එය තවත් වැඩි කළා.

ප්‍රබෝධි: මම MMCA ශ්‍රී ලංකාහි සමාජ මාධ්‍ය යම් කාලයක සිට නිරීක්ෂණය කළ නමුත් විභාග හේතුවෙන් මට එය නැරඹීමට යාමට කාලයක් වෙන් කරගන්න බැරිවුණා. පසුව, මම මගේ පෙම්වතා සමඟ 'මුණගැසීම්' ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි අතර එය ඉතා සිත් ඇද ගන්නා සුළු එකක් වුණා. එයින් කෙටි කාලයකට පසු මම බාහිර අධ්‍යාපනඥ අවස්ථාව පිළිබඳ දැනගත් අතර එයට යුහුසුළුව අයදුම් කළා.

විරන්දි: කලා ලෝලියෙක් වශයෙන් මම කලාව පදනම් කරගත් රැකියාවක් සෙව්වා. මගේ ඉගෙනීම් කටයුතුවලට අවශ්‍ය නම්‍යතාවය ලබාදෙන අතරේ කලා අවකාශයක් තුළ කලාව පිළිබඳව ඉගෙනීමේ සහ නරඹන්නන් හා අනෙකුත් කලා ලෝලීන් සමඟ ගනුදෙනු කිරීමේ හැකියාව මාව ආකර්ෂණය කරගත්තා.

## බාහිර අධ්‍යාපනඥයෙකු ලෙස ඔබ ලැබූ අත්දැකීමේ කැපීපෙනෙන අවස්ථා මොනවා ද?

රෙසාහ්: බාහිර අධ්‍යාපනඥයෙකු වීම බහු-විධ භූමිකාවක්. විවිධ පසුබිම්වලින් පැමිණෙන මිනිසුන්, විශේෂයෙන් ම කලා ලෝකයේ ම අය හමුවීමට හා ඔවුන් සමඟ කතා කිරීමට හැකිවීම මට සුවිශේෂී අවස්ථා වෙනවා. ළමුන් සමඟ MMCA Afterschoolහි වැඩ කිරීම හා උගන්වන අතරේ ඔවුන්ගෙන් ඉගෙන ගැනීම මම අනිවාර්යයෙන් ම මෙතැනින් රැගෙන යන දෙයක්. අවසාන වශයෙන්, 'අක්කර 88හි' නිෂ්පාදනයේ හා ප්‍රදර්ශන නිර්මාණ සැලසුම්කරණයේ නියැලීමට ලැබීම MMCA ශ්‍රී ලංකාහි මගේ ලොකු ම කැපීපෙනෙන අවස්ථාවලින් එකක් වෙනවා.

මැතිව්: විදේශිකයන්, පාසල් සිසුන්, හා දේශීය ජනතාව යන සියලු වර්ගවල නරඹන්නන් කණ්ඩායම්වලට සංචාර ලබාදීම මට අනිවාර්යයෙන් ම සුවිශේෂියි. සෑම විටක ම වාගේ කලාකෘති දෙස වෙනස් දෘෂ්ටිකෝණයකින් බැලීමට ඔවුන් මට උපකාර කරනවා. එමෙන් ම, MMCA Afterschoolහි කොටසක් වීමට හැකිවීම හා ළමුන් සඳහා විවිධ විනෝදජනක සැසි මෙහෙයවීම මම සෑමවිට ම සතුටට පත් වෙන දෙයක්.

හුසේන්: විශිෂ්ට ප්‍රදර්ශනයක් ඉදිරිපත් කිරීමේදී අන්තර්ගතවන කොටස්වන ඉදිකිරීම් අදියරේ සිට මහා එළිදැක්වීම දක්වා විහිදෙන කලා කළමනාකරණයේ මම පුළුල් ලෙස නියැලී සිටිනවා. මෙම අත්දැකීම තුළින් කලා අභිරක්ෂණය, ස්ථාපනය, සහ චිත්තාකර්ෂණීය ප්‍රදර්ශන නිර්මාණය කිරීමට අවශ්‍ය සූක්ෂ්ම සම්බන්ධීකරණයට අදාළ මගේ ප්‍රවීණත්වය වැඩි දියුණු කරගෙන තිබෙනවා. අභිරක්ෂකයන් සමඟ වැඩ කිරීම හා සෘජු අත්දැකීම් ලැබීම මම කැමති තවත් දෙයක්.

ප්‍රබෝධි: බාහිර අධ්‍යාපනඥයෙකු ලෙස මම සම්බන්ධවී වැඩිකල් නොවූවත් මම ලැබූ අත්දැකීම ඉතා හොඳ එකක්. මෙය මගේ පළමු රැකියාව වන අතර එහි ලැබූ වටිනා ම දෙය එම අත්දැකීම බව කීම සාධාරණයි. ප්‍රදර්ශනයක් සඳහා අවශ්‍ය වන බොහෝ දේ ගැන මට ඉගෙනගැනීමට පුළුවන් වුණු අතර එම දැනුමෙන් බොහෝමයක්

නරඹන්නන්ට සන්නිවේදනය කිරීමට හැකි වුණා. එමෙන් ම ළමයින්, විවිධ රටවල්වලින් පැමිණෙන සංචාරකයන්, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රජාවල මිනිසුන්, හා විවිධ වෘත්තීන්වල නියැලෙන නරඹන්නන් ඇතුළු විවිධ නරඹන්නන් පිරිසක් සමඟ ගනුදෙනුකිරීමට ලැබීම පිළිබඳව මම ඉතාමත් සතුටට පත් වෙනවා.

විරන්දි: MMCA ශ්‍රී ලංකාහි මට වඩාත් ප්‍රිය මතක බොහෝමයක් නරඹන්නන් සමඟ කළ මගේ සංවාදයි. කලාව හා ජීවිතය පිළිබඳ ගැඹුරු සංවාදයක් විශේෂයෙන් ම ඔබට එවෙලේ මුණගැසුණු අය සමඟ බෙදාගැනීම තුළ ඉතාමත් අපූරු දෙයක් තියෙනවා. මිනිසුන් කලාකෘති සමඟ විවිධ ආකාරවලින් සම්බන්ධ වෙන අයුරු දැකීම ඉතා ප්‍රබලව දැනෙන දෙයක්.

**MMCA Sri Lankaහි රැකියාව ඔබේ වෘත්තීය ජීවිතයට කෙසේ දායක වනු ඇතැයි ඔබ සිතනවා ද?**

රෙසාහ්: MMCA ශ්‍රී ලංකා මගේ වෘත්තීය ජීවිතයේ ආරම්භක ලක්ෂ්‍යය වෙනවා මෙන් ම එයට විශාල බලපෑමක් ඇතිකර තිබෙනවා. ග්‍රැෆික් නිර්මාණකරුවෙකු වන මම බහු-ක්ෂේත්‍ර නිර්මාණකරුවෙකු වීමට වැඩ කරන අතර, උපදෙස් හා මග පෙන්වීම්, සම්පත්, සංකල්පිත චින්තනය, සහ ඉදිරියට යාමට ඇති අවස්ථා තුළින් MMCA ශ්‍රී ලංකා මගේ වෘත්තීය ජීවිතයට දායකවී තිබෙනවා. බාහිර අධ්‍යාපනඥයෙකු හා සීමාවාසිකයෙකු ලෙස මම MMCA ශ්‍රී ලංකාහි සිටියේ වසරක කාලයක් පමණවූවත්, වර්ධනය වීමට ලැබුණු සහයෝගය හා අවස්ථා ප්‍රමාණය අති විශාලයි.

මැතිව්: MMCA ශ්‍රී ලංකාහි ප්‍රදර්ශන තුනක නිෂ්පාදනය සඳහා සීමාවාසිකයෙකු හා බාහිර අධ්‍යාපනඥයෙකු ලෙස කටයුතු කිරීමට ලැබීමෙන් මම අලුත් අවස්ථා හා අත්දැකීම් බොහෝමයකට නිරාවරණය වුණා. මෙතුළින් මම ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීමට හා කාලසටහනට අනුව දියත් කිරීමට, ප්‍රදර්ශනයක් සඳහා අවකාශයක් යොදාගන්නේ කෙසේදැයි අවබෝධ කරගැනීමට, හා තවත් බොහෝ දේ පිළිබඳ ඉගෙන ගත්තා. කෞතුකාගාරයේදී මට ලැබුණු පුහුණුවට ස්තූතිවන්ත වන්නට මම දැන් චිත්‍ර ස්ථාපන සහ චිත්‍ර නිෂ්පාදනයේ ද වැඩ කරනවා.

හුසේන්: නරඹන්නන් සමඟ කටයුතු කිරීමේ තනතුරු ගණනාවක් සමඟින් MMCA ශ්‍රී ලංකාහි මගේ අත්දැකීම නිෂ්පාදනය හා කලාකෘති පරිහරණය යන විවිධ මෙහෙයුම් පැති හරහා විහිදෙන එකක්. මෙම පුළුල් නිරාවරණය සහ මගේ වත්මන් වගකීම්, සාර්ථක වෘත්තීය ගමනකට අත්‍යවශ්‍ය සමබර අන්තර් පුද්ගල සහ තාක්ෂණිකකුසලතා කට්ටලයක් වර්ධනය කරගැනීමට මට උපකාරවී තිබෙනවා.

ප්‍රබෝධි: මම ජනමාධ්‍ය හා පුවත්පත් කලාව හදාරන අතර, ඒ ක්ෂේත්‍රයට සන්නිවේදන කුසලතා අත්‍යවශ්‍යයි. විවිධ නරඹන්නන් කණ්ඩායම් සමඟ කතා කිරීමෙන් හා ඔවුන් සමඟ ඵලදායී සන්නිවේදනයේ නියැලීමෙන් මම සෘජු වෘත්තීය අත්දැකීම් ලබාගත්තා. අපගේ නරඹන්නන්ව කලාකෘති සමඟ නියැලීමට යොදා ගන්නා කතන්දර කීමේ ක්‍රමය මගේ කුසලතා මත ධනාත්මක බලපෑමක් ඇති කර තිබෙනවා.

විරන්දි: ලෝකය හා කලාව දෙස අප බලන සහ, ඒ සමඟ සම්බන්ධවන ආකාරවල ඇති වෙනස්කම් අගයන හා ඒවාට ගරුකරන අතර ම, නරඹන්නන්ගේ අත්දැකීම් අවබෝධ කරගන්නේ කෙසේදැයි දැනගැනීම සහ සුදුසු හා ද්වි-මාර්ගික සංවාද

පැවැත්වීම MMCA ශ්‍රී ලංකාහිදී මම දියුණුකළ කුසලතා වෙනවා. මෙය මගේ අනාගත වෘත්තීය ජීවිතයට අනිවාර්යයෙන් ම හොඳ පුහුණුවක් ලබා දුන්නා.